## 2007 අංක 07 දරණසමාගම් පනතේ 34 වගන්තිය යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කිරීම සඳහා උපදෙස්

34 වගන්තියේ (01) උප වගන්තියෙන් මෙසේ සදහන් කර ඇත.

(01) ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පිහිටුවනු ලැබීමට ආසන්නව ඇති සංගමයක්වාණිජ්‍යය, කලාව , විද්‍යාව , ආගම , පුණ්‍ය කටයුතු ක්‍රීඩා හෝ වෙනත් ප්‍රයෝජනවත් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවනු ලබන බවටත්, සමාගමේ ලාභ කිසිවක් වේනම් එම ලාභ සහවෙනත් ආදායම් එහි පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහාම යෙදවීමටද එහි සාමාජිකයින්හට යම් ලාභාංශයක් ගෙවීමට තහනම් කිරීමට ද ඒ සංගමය අදහස් කරන බවටත් රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක,

(අ) සංගමය එහි නමට "සීමා සහිත" යන වචනය එකතු කිරීමෙන් තොරව ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කරනු ලැබිය හැකි බව රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍රයක් මගින් ප්‍රකාශ කරනු ලැබේ.

(ආ) එම සංගමය ඒ අනුව ලියාපදිංචි කරනු ලැබූ විට සියලු වරප්‍රසාද භුක්ති විදිය යුතුය. තවද මේ වගන්තියේ විධිවිධාන වලට යටත්ව ඒකී සංගමය සියලු බැදීම්වලට ද යටත් විය යුතුය.

02. මෙකී විධිවිධානයන්ට යටත්ව බලපත්‍රයක් ප්‍රදානය කිරීම පූර්ණ වශයෙන්ම රෙජිස්ට්‍රාර්වරයාගේ අභිමතය පරිදි සිදුවිය යුතුය.

03.රෙජිස්ට්‍රාර්වරයාගේ අභිමතය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී , මෙහි ලියාපදිංචිය අපේක්ෂා කරන සංගමයේ අරමුණු ඉටුකිරීමේ හැකියාව සහ එහි පවතින මූල්‍යමය තත්වය පිරික්සීම සඳහා එම සංගමය කැදවීමේ බලතල රෙජිස්ට්‍රාර්වරයා සතු වන්නේ ය.

04. අයදුම්කරුවන්, ප්‍රථම පියවර වශයෙන්;

(අ) නියමිත ගාස්තු සමග සංගමයේ නම අනුමත කිරීම සඳහා නියමිත අයදුම්පත සම්පූර්ණකර ඉදිරිපත් කළ යුතුය. නම අනුමත කිරීම07 (01) වගන්තියේ නියමයන්ට යටත්වන අතර උප වගන්තිය (02)හි සලකා ඇති පරිදි අවශ්‍ය වුවහොත් අමාත්‍යවරයාගේ කැමැත්ත ලබාගැනීමට ද යටත් වේ.

(ආ) නම් අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලයේ කැමැත්ත ඉල්ලා සිටින අවස්ථාවක් ඇති වුවහොත් මෙහි (02) වන උප වගන්තියේ (අ) (ආ) හෝ (ඇ) ශීර්ෂයන්හි ලේඛණගත කර ඇති වචන යොදාගැනීම සඳහා හේතු සහිතව ලිඛිත ඉල්ලීමක් අයදුම්පත්වලට අමුණා ඉදිරිපත්කළ යුතු ය.

(ඇ) සංගමයේ පරමාර්ථයන් ඇතුලත්කර සකසන ලද සංගමයේ ව්‍යවස්ථාවේ යෝජිත වගන්තිවල කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සහ එකී සංගමය ඇවර කිරීමට ලක්වුවහොත් වත්කම් සඳහා එක් එක් සාමාජිකයා දායකවීමට අපේක්ෂිත මුදලද සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

(05) කෙටුම්පත් කරනු ලබන ව්‍යවස්ථාවලියේපහත සඳහන් කරුණු අඩංගු විය යුතුය. (උචිත වෙනස්කම් කිරීම සඳහාආදර්ශ පළමු උප ලේඛණයේ ව්‍යවස්ථාවලිය යොදා ගත හැක )

(අ) සමාගමේ පරමාර්ථ,
(ආ) සමාගමේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්,
(ඇ) සමාගමේ කළමනාකරණය සහ පරිපාලනය.
ආයෝජන බලතල ඇතුලත් කළ යුතු නම් එය උචිත ලෙස අංකනය කර පහත සම්මත වගන්තියන්හි දැක්වෙන ආකාරයෙන් වියයුතුය.
සංගමයේකාර්යයන් සඳහා ක්ෂණිකව අවශ්‍ය නොවන මුදල් සුදුසු යැයි හැඟෙන පරිදි සුරැකුම් හෝ දේපළවල ආයෝජනය කළ හැකිය. ( එම අවස්ථාව වන විට පනවා ඇති හෝ නී ති යෙන් ඇ ති ක ර ඇ ති කොන් දේ සි ගැ න නොස ල කා)

(i)සංගමය පක්ෂග්‍රාහී දේශපාලන ස්වභාවයක් නොදැරිය යුතු අතර එවැනි අරමුණක් වෙනුවෙන් තම අරමුදල්වලින් හෝ වෙනත් කවර හෝ ආකාරයකින් ආධාර නොකරනු ලැබිය යුතුය .

(ii) කුමන හෝ භාරකාර මණ්ඩලවලට යටත්ව කවර හෝ දේපළක් සංගමය විසින් ලබා ගන්නේ නම්,එම භාරකාර මණ්ඩලයට නීතියෙන් අවසර දී ඇති ආකාරයට පමණක් එම දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ආයෝජන කිරීම සිදු කළ යුතුයි.

(iii) සංගමයේ කිසියම් වස්තුවක් හෝ දේපළක් වෘත්තීය සංගමයක් බිහි කිරීමට හේතු වේ නම් සංගමය විසින් තම අරමුදලින් ඒවැනි වස්තුවක් හෝ දේපළක් සඳහා ආධාර නොකරනු ලැබිය යුතු අතර සංගමයේ සාමාජිකයන් විසින් හෝ අනෙක් අය විසින් පිළිපැදීම සඳහා රෙගුලාසි (සීමා) හෝ කොන්දේසි පැනවීම හෝ පැනවීමට යත්න දැරීම හෝ නොකළයුතුය

(iv) සංගමය විසින් කුමන හෝ දේපළක් ලබා ගෙන තම සන්තකයේ තබා ගන්නේ නම් සංගමය විසින් එම දේපළ සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය සහ අවසරය හෝනීතිය මගින් සලසා ඇතිඅවසරය, අනුමැතිය සහ එකඟත්වය නොමැතිව විකිණීම, උකස් කිරීම, දේපළ පිළිබඳ ගිවිසුම්ඇතිකර ගැනීම හෝ බදු දීම නොකළ යුතුය. එවැනි

දේපළක් සම්බන්ධයෙන් සංගමයේ කළමනාකරණ සභාවට හෝ පාලන මණ්ඩලයට නඩු පැවරිය හැකිවන අතර ඔවුන් විසින් තමන්ගේම ක්‍රියා කලාපයන් නොසලකාහැරීම සහ පැහැර හැරීම සම්බන්ධයෙන් සහ සංස්ථාගත කිරීමක් සිදුකර නොමැති නම්, එවැනි කළමනාකරණ සභාවක් හෝ පාලන මණ්ඩලයක් විසින් එවැනි දේපළක පරිපාලනය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුව තිබූ ආකාරයටම සහ එම ප්‍රමාණයටම එහි පරිපාලනය සම්බන්ධයෙන් ද වගකිව යුතුය.

පහත සඳහන් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව බලපත්‍රයක් ලබා දෙනු ලබන අතර නියමිත පරිදි ව්‍යවස්ථාවන් (වගන්ති ) අංකනය කර ඉදිරිපත් කළ යුතුය.

* සංගමයේ දේපළවල ආදායම කවුරුන් විසින් ලබා ගත්ත ද එය සංගමයට අදාළ මෙම සංස්ථා පත්‍රයේ සඳහන් කර ඇති ආකාරයට හුදෙක් සංගමයේ අරමුණු වැඩි දියුණු කිරීම සඳහා පමණක් යෙදවිය යුතු අතර එයින් කොටසක් හෝ ඍජුව හෝ වක්‍රව සංගමයේ සාමාජිකයන්හට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ වෙනත් කවර ආකාරයකින් හෝ ලාභ වශයෙන් ගෙවීම හෝ මාරු කිරීම නොකළ යුතුය.එතකුදු වුවත් සංගමයේ නිළධාරියකු හෝ සේවකයකු හෝ සංගමයේ කවර හෝ සාමාජිකයකු විසින් සංගමයට කරන ලද කුමන හෝ සේවයක් සඳහා සාධාරණ හා නියමිත පාරිශ්‍රමිකයන් වශයෙන් යහපත් චේතනාවෙන් කරනු ලබන ගෙවීමක් සඳහා හෝ එසේත් නොමැතිනම් සංගමයේ සාමාජිකයකු විසින් ණයට දෙන ලද මුදලකට ශ්‍රී ලංකා මහා බැංකුව විසින් එම කාලය සඳහා අනුමත කරන ලද පොලී අනුපාතයකට නොවැඩි පොලියක් ගෙවීමක් බද්දට හෝ සංගමයේ සාමාජිකයකු විසින් සංගමයට කුලියට හෝ පවරා දෙන ලද භූමි භාගයක් වෙනුවෙන් සාධාරණ බදු මුදලක් ගෙවීමට හෝ මෙහි සඳහන් කිසිදු වගන්තියකින් බාධාවක් නොවිය යුතුය,එතකුදු වුවත් සංගමයේ කිසිදු සාමාජිකයකු සංගමයේ වැටුප් ලබන කිසිදු තනතුරකට හෝ සංගමයෙන් ගාස්තු ගෙවන තනතුරකට පත්නොකළ යුතු අතර සංගමයේ හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයකුට තම අතින් දරණ වියදම් ආපසු ගෙවීම, දෙන ලද ණය මුදල් සඳහා ඉහත සඳහන් පොළී අනුපාතයන්ට අනුව පොලී ගෙවීම හා බද්දට හෝ කුලියට දෙන ලද භූමි භාගයක් වෙනුවෙන් සාධාරණ බදු මුදලක් ගෙවීමක් හැරඅන් කිසිදු පාරිශ්‍රමිකයක් හෝ මුදල් හෝ මුදල් වටිනාකමට දෙනු ලබන වරප්‍රසාද හෝ ලබා නොදිය යුතුය. එතකුදු වුවත් ඉහත අවසන් වශයෙන් සඳහන් කිරීමට යෙදුණු විධිවිධාන කළමනාකරණ සංගමයේ හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයන් සාමාජිකත්වය දරණු ලබන කවර හෝ සමාගමකට ගෙවීමක් කිරීම සඳහා බල නොපාන අතර සාමාජිකයකු එම සමාගමේ මූල ධනයෙන් 1/100 කට වැඩි කොටස් ප්‍රමාණයක් නොදැරිය යුතු අතර ඒවැනි ගෙවීමක් සම්බන්ධයෙන් ඔහුට ලැබිය හැකි කවර හෝ ලාභ කොටස් සඳහා වගකීම දැරීමට ඔහු බැඳී නොසිටිය යුතුය.

- සංගමයේ දැනට ක්‍රියාත්මක වන මෙම සංස්ථා පත්‍රය ඇතුලත් කරනු ලබන එකතු කිරීමක්,වෙනස් කිරීමක් හෝ සංශෝධනයක් වේ නම් ඒවා කලින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කොට අනුමත කරවා ගෙන නොමැතිනම් එසේ එකතු කිරීම, වෙනස් කිරීමහෝ සංශෝධන කිසිවක් සිදු නොකළ යුතුය.
- 2007 අංක 07 දරණ සමාගම් පනතේ 34 (1) (අ) ඡේදයට අනුව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලබන්නේ කවර හෝ කොන්දේසිවලට යටත්ව ද එම කොන්දේසි මෙම සංස්ථා පත්‍රයේ 4 සහ 5 ඡේදවලට ඇතුලත් විය යුතුය.
- සංගමයේ සෑම සාමාජිකයකුටම ඔහුගේ සාමාජිකත්වය අවසන් වීමට පෙර සංගමය විසින් ගෙවිය යුතු ණය සහ බැදීම් සහ සංගමයේ කටයුතු අවසන් කිරීමේ වියදම්, ගාස්තු සහ පිරිවැය ගෙවීම් සඳහාත් එමෙන්ම ආධාරවල අයිතින් ඔවුන් අතර සමසේ බෙදීයාමට කටයුතු පිළියෙල කිරීම සඳහාත් අවශ්‍ය පරිදි රුපියල් සියයකට නොවැඩි මුදලක් එම සාමාජිකයා සාමාජිකත්වය දරණ අතරතුර හෝ ඔහුගේ සාමාජිකත්වය අවසන් වී වසරක් ඇතුලත හෝ සංගමයේ කටයුතු අවසන් කළේ නම් සංගමයේ වත්කම්වලට පිරිනැමීම කළ යුතුය.
- සංගමය විසුරුවා හැරීමෙන් පසු හෝ එහි කටයුතු අවසන් කොට එහි සියලුම ණය සහ බැදීම් ගෙවා දැමීමෙන් පසු කවර ආකාරයකට මුදල් හෝ දේපළක් ඉතිරිව තිබේ නම් එය සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර එකී සංගමයට සමාන අරමුණු ඇති වෙනත් සංගමයකට ලබාදිය යුතුය. එවැනි සංවිධානයක් හෝ සංගමයක් සාමාජිකයන් විසින් සංගමය විසුරුවා හරින අවස්ථාවේදී හෝ ඊට පෙර සොයා ගැනීම කළ යුතු අතර එසේ සොයා ගැනීමට නොහැකි වුවහොත් පුණ්‍ය කටයුතු අරමුදල් සඳහා අධිකරණ බලතල ඇති විනිශ්චකාරවරයකු විසින් තීරණය කළ යුතු අතර එමගින් එකී විධිවිධාන ක්‍රියාත්මක කළ නොහැකි නම් එම මුදල් හෝ දේපළ පුණ්‍ය කටයුක්තක් සඳහා ලබාදීම කළ යුතුය.
- ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි සහ අධීක්ෂණය ) කිරීමේ පනත යටතේ දැක්වෙන ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වන සංගමයක් සංස්ථාගත කිරීමෙන් පසුව එම පනත යටතේ ලියා පදිංචි කිරීමට පියවර ගත යුතුය.

(6) රෙජිස්ට්‍රාර්වරයා විසින් කෙටුම්පත අනුමත කිරීම සඳහා පරමාර්ථයන් සඳහන් කරමින් සහ විරෝධතා ඇත්නම් ලබා දෙන ලෙස ඉල්ලමින් දිනපතා ජාතික පුවත්පතක ලියා පදිංචිය අපේක්ෂා කරන අයගේ වියදමින් දැන්වීමක් පළකර(ආදර්ශ අයදුම්පත දී ඇත) දී ඇති දිනයට පෙර දැන්වීම් පල කළ දිනයේ සිට සති 03 කට අඩු නොවන කාලයක් තුල රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම්දීම.

(7) ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත පිළිගැනීම හා ප්‍රතික්ෂේප කිරීම රඳා පවතින්නේ ලැබී ඇති විරෝධතා පදනම් කර ගෙනය.

(8) පහත සඳහන් ලේඛන අමුණා ලියාපදිංචි ගාස්තු සමඟ (ෆෝම් 5) සම්පූර්ණ කර ලියාපදිංචිය සඳහා වූ අයදුම්පත ඉදිරිපත් කළ යුතුයි.

(අ) විශේෂයෙන් සඳහන් කළ රෙගුලාසි සංගමයේ වගන්ති තුළ අන්තර්ගත කොට පිටපත් දෙකක් සහිතව යතුරු ලියනය කර නැතහොත් මුද්‍රණය කර ඉදිරිපත් කළ යුතුයි.

(ආ) අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් ක්‍රියාකිරීමට යන එක් එක් ආරම්භක අධ්‍යක්ෂකවරයෙකුගේ කැමැත්ත 203 යටතේ ප්‍රකාශ කිරීම නියමිත ආකෘතිය (ෆෝම් 5) සහ

(ඉ) සමාගමේ ලේකම්වරයා වශයෙන් කටයුතු කිරීමට යන ආරම්භක ලේකම්වරයාගේ කැමැත්ත 221 යටතේ (ෆෝම් 19) ප්‍රකාශ කිරීම.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලදී.

'සමාගම් මැදුර'

400, ඩී ආර් විජේවර්ධන මාවත

කොළඹ 10.

දිනය . 2019 ජුනි 08 වැනි දින